පැරණි ලක්දිව රජවරුන් විසින් පිරිනමන ලද තුලාභාර දාන පිළිබඳ විමර්ශනයක්

ඩබ්ලිව්. ඒ. හිරණ්‍යා ජයතිලක
ඉතිහාස අධ්‍යයන අංශය, කැලණිය විශ්වවිද්‍යාලය, ශ්‍රී ලංකාව

සංක්ෂේපය

තුලාභාර දාන යනු යම් පුද්ගලයෙකු හෝ කිහිපදෙනෙකු තරාදියේ එක් පැත්තකට නැග තමාගේ බරට සමානව සිටින සේ තරාදියේ අනෙක් පැත්තට වස්තුව පුරවා කිරා දන්දීමයි. සංක්ෂිප්තව හඳුනාගන්නේ නම් බරට බර දන්දීමකි. ඒ සඳහා කටයුතු කළ පාලකයා ජන ප්‍රසාදය දිනූ දානපතියකු බවට පත් වූ වග අනාවරණය කර ගත හැකි ය. මේ පුණ්‍ය කටයුත්ත සිදු කළ ආකාර විවිධ ය. එහි දී තුලාභාර දානය විශේෂිත වේ. මේ සිරිත පැරණි ලක්දිව රජවරුන් ද ක්‍රියාවට නංවා තිබේ. අනුරාධපුර පොළොන්නරු යුගයන්හි දී මෙරට පාලකයන් දුන් තුලාභාර දාන හා එම දාන ලබාදීමේ අරමුණු පිළිබඳව විමර්ශනයක් කිරීම මෙම පර්යේෂණයේ මූලික අරමුණ විය.

තුලාභාර දානයේ ආරම්භය පිළිබඳ පරීක්ෂා කිරීමේදී ඉන්දියානු දේශපාලනය තුලින් ද මෙම පුණ්‍ය කටයුත්ත සාර්ථකව පාලන තන්ත්‍රයක් තුල පවත්වාගෙන ආ බව අනාවරණය වෙයි. එමෙන් ම බෞද්ධ ජාතක කථා ඇසුරෙන් සතුන්ගේ බරට වස්තුව දන්දෙන ලද අවස්ථා ද හමුවේ. මෙය රජු පෞද්ගලිකව සිදු කළ ද රජු වෙතින් ජනයාට ලද ජන ප්‍රසාදයකි; සුබ සාධනයකි. මෙහිදී ප්‍රාථමික හා ද්විතියික මූලාශ්‍රය පරිශීලනය කිරීම පර්යේෂණ ක්‍රමවේදය වශයෙන් යොදා ගැනුණි.

අනුරාධපුර රජවරුන් තනිව දුන් තුලාභාර දානය පොළොන්නරු යුගය වන විට රාජකීය පවුල තුළට විසරණයවීමක් දක්නට ලැබේ. නිශ්ශංකමල්ල රජතුමාගේ පාලන කාලය තුළ පෙර රජවරුන් නොකළ ආකාරයේ තුලාභාර දාන දී තිබේ. එහෙත් පොළොන්නරු යුගයෙන් පසුව මේ සිරිත ක්‍රමයෙන් අභාවයට යන්නට ඇත. රාජ්‍ය අනුග්‍රහය මත ඉතා විධිමත් ආකාරයෙන් පවත්වාගෙන යනු ලැබූ තුලාභාර දානය, රාජ්‍යය, රජු හා ජනයා සුරක්ෂිත කරලීම පිණිස මහත් පිටුවහලක් වී ඇත. මේ තුළින් විවිධාකාරයේ අවශ්‍යතා සපුරාගැනීමට ද දායකත්වය ජනයාට ලැබෙන්නට ඇත.

තුලාභාර දානය ලක්දිව බොහෝදුරට ක්‍රියාත්මක කර ඇත්තේ උත්සවාකාරයෙනි. එමෙන් ම මෙරට පැවැත් වූ තුලාභාර දානය තුළින් දන්දුන් වස්තු පිළිබඳව ද කරුණු හෙළිදරව් කර ගැනීමේ හැකියාව පවතී. පැරණි ලක්දිව තුලාභාර දානය දේශපාලන ක්ෂේත්‍රයට හා ජනතා ප්‍රසාදයට සුභසාධනයට ඉහළ දායකත්වයක් ලබා දුන් බව මෙමඟින් නිගමනය කළ හැකි ය.

ප්‍රමුඛ පදඃ තුලාභාර දානය, ජනතා සුභසාධනය, නිශ්ශංකමල්ල රජතුමා

A review of giving of tulābāra dāna by kings of ancient Lanka

W.A.Hiranya Jayathilaka
Department of History, University of Kelaniya, Sri Lanka

Abstract

The means of the donation of equivalent fraction (*tulābāra dāna*) is, to donate wealth to the people to match the weight of a person. In brief, it is a donation of wealth, equal to one's weight measured by a weighing scale. The kings became popular owing to this practice. The donations were done in various ways. Among them the *tulābāra dāna* was a special kind of giving. The objective of this research is to evaluate the donations made by the rulers who lived in Anurādhapura and Polonnaruwa kingdoms. (6 B. C.-1215 A. C.)

In India too, records show the showering of wealth according to weight of a person. This is evident from the *Jātaka stories*. It is mentioned that they have donated wealth, equal to the weight of their animals, too. Furthermore in this research I expect to identify the items which were given as *tulābāra dāna*. Even though it was done by the King personally, later it facilitated welfare for the people. As the methodology of this research I have studied part II of *Mahāwaṃsa* and Epigraphy as primary sources.

The method of donation was changed after the kingdom of Anurādhapura. King Nissankamalla was a great practitioner of this art of giving. The existence of the above practice cannot be seen after the Polonnaruwa Period. The *tulābāra dāna* was practiced in a ceremonial way, according to ancient rituals.

Keywords : *tulābāra dāna*, Welfare, King Niśśankamalla, Weighing Scale

හැඳින්වීම

ශ්‍රී ලංකාවේ ඉතිහාසය නිරීක්ෂණය කිරීමේ දී පැරණි රජවරු (ඒකාධිපති වියරුවෙන් දැඟලූ ආඥාදායක පාලනයක් ගෙන ගිය පැසිස්ට් පාලකයන් නොවූ බව සත්‍යයකි.) ඔවුහු බෞද්ධ දේශපාලන දර්ශනයෙන් ශික්ෂිත විශිෂ්ට පාලකයෝ වූහ. තම වගකීම හා යුතුකම කුමක් දැයි අවබෝධ කොට ගෙන පාලනය මෙහෙය වූ පිරිසක් වූහ. සමාජ සුභසාධන කාර්යයට ශ්‍රී ලාංකික රජවරුන් පෙළඹුණේ බුදුසමයේ ආලෝකය ඍජුවම රාජ්‍යයට එල්ල වූ නිසාය. ශ්‍රී ලංකාවේ දේශපාලන ඉතිහාසය මනාව පරීක්ෂාකර බලන විට ලාංකික පැරණි රජවරුන් ජනතා සුබ සාධන ක්‍රියාදාමයක් ක්‍රි.පූ. තුන් වන සියවසෙන් අනතුරුව විශිෂ්ටතම ආකාරයෙන් ක්‍රියාවට නංවා තිබෙන බවට ඉතිහාසය සාක්ෂි දරයි.

රජ යන තනතුර ප්‍රධාන දේශපාලන විධායකය ලෙස හඳුනා ගත හැකි ය. එම දේශපාලන විධායකයට නොහොත් රජුට පැවරෙන කටයුත්තකි, මහජන සුභසාධනය. ආර්ථිකය, අධ්‍යාපනය, ආහාර, කෘෂිකර්මය වැනි බොහෝ සුබ සාධන කාර්යයන්හි නියුක්තවෙමින් ලාංකිකයාගේ ජීවන මට්ටම උසස් තත්වයකට ගෙන ඒමට උත්සාහ දරා තිබෙන බව පෙනේ. රටක ආර්ථිකය සුශික්ෂිත නම් ධනයෙන් ආඪ්‍ය මිනිසුන් වාසය කරයි නම් රට සමෘද්ධිමත් ය.

පැරණි ශ්‍රී ලාංකික රජවරු රටවැසියාගේ සුභසාධනය පිළිබඳ විශේෂ සැලකිල්ලක් දැක්වූහ. ඒ නිසා ලාංකික ජනතාව පමණක් නොව භික්ෂු සංඝයා වහන්සේලා ද දාන පිරිනැමීමට මහත් උනන්දුවකින් කටයුතු කළ බව පැහැදිලිවම පෙනේ. මේ ඔස්සේ රජවරු නිරන්තරයෙන් උත්සාහ කළේ ජනතා ප්‍රසාදය ඇති කර ගැනීමට ය. එය ඔවුන්ගේ රාජ්‍ය රඳා පැවැත්මේ ප්‍රවර්ධනයට මහඟු පිටිවහලක් විය.

ලක්දිවට දානමය පුණ්‍ය කර්මය උරුම වූයේ බුදුදහමේ ආභාසය ලැබීමත් සමඟ ය. පුණ්‍ය ක්‍රියා සංවර්ධනය උදෙසා යොදාගැනුණි. දානය, සතර සංග්‍රහ වස්තුවෙහි මෙන් ම දස රාජ ධර්ම අතරෙහි ද යහපත් රාජ්‍ය පාලනයක ගුණ ධර්මයක් උපාංගයක් ලෙස සැලකූ බව පෙනේ. එසේ නම් පාලකයා තුළ දානමය කටයුතු පිළිබඳ මනා අවබෝධයක් පැවතුණේ ය යන්න පිළිගැනීම අසීරු නොවේ. අනුරාධපුර පොළොන්නරු නගර නිර්මාණකරණයේදී පවා දාන ශාලා ඉදිකර භික්ෂූන්ගේ පූජාර්හ වස්තුවක් බවට පත් කොට තිබේ. ඇතැම් විටෙක මේ දාන විධි පිළිබඳ උපදෙස් භික්ෂූන්වහන්සේ වෙතින් ලැබුණා ද විය හැකි ය. කෙසේවෙතත් ජනයාගේ සුභසෙත පිණිසත් ආගමික අභිවෘද්ධිය පිණිසත් මනා පරිපාලනයක් සඳහාත් රජු දානශාලා වැනි ආයතන ඉදිකරමින් දාන පිරිනැමීමට කටයුතු කර තිබේ.

රජවරුන්ගේ මහජන සේවයේ එක් අංගයක් වන දිළිඳු ජනයාට ධනය ලබාදීම පිළිබඳ විමසන විට රජවරුන්ගෙන් ඒ සඳහා ලද දායකත්වය අමතක කළ නොහැකි ය. ලක්දිව බෞද්ධ රටක් වූ පසු දානමය පුණ්‍ය කර්මයෙහි නොසිතූ විරූ දියුණුවක් ඇති කිරීමට කිසිදු බාධාවක් ඇතැයි සිතිය නොහැකි ය. ලක්දිව භාතිකාභය රජු, දෙවන දප්පුල, දෙවන සේන, දෙවන උදය වැනි රජවරුන් අනුගමනය කර තිබෙන සුභසාධනය පිළිබඳ අවලෝකනය කරන විට ඒ බව තහවුරු වෙයි. නිශ්ශංකමල්ල රජු ගත් විට තුලාභාර දාන

පිරිනැමීමේ ප්‍රවීණයෙකි. එතුමාගේ මේ ක්‍රියාකලාපය හඳුනාගැනීම පහසු වන්නේ එතුමාම පිහිටුවා ඇති සෙල්ලිපි පරීක්ෂාකිරීමෙනි.

මෙම තුලාභාර දාන ක්‍රමය භාරතීය ක්‍රමවේදයට සමාන වූ දාන ක්‍රමයක් සේ ද සිතිය හැකි ය. මිනිසුන් පමණක් නොව සතුන්ගේ බරට ද දාන වස්තු පිරිනමා තිබේ. කෙසේවෙතත් මේ ලාංකීය දාන පිරිනැමීමේ පසුබිමට ඉන්දීය ආභාසය ද ලැබ ලංකාවේ දන්දීමේ සංකල්පය සංවර්ධනයට තුලාභාර ක්‍රමය හේතුවන්නට ඇත. ඒ සඳහා ප්‍රජා නායකයෙකු හා රාජ්‍ය අනුශාසකයෙකු වූ භික්ෂූන්වහන්සේලාගේ හිතසුව පිණිස මෙන්ම ප්‍රජාවගේ හිතසුව පිණිස ද තුලාභාර දාන පිරිනැමීම විශේෂිත ය. ආගමික සංකල්පය පෙරදැරි කොට ගෙන පෙර රජවරුන් අනුගමනය කළ මේ සුභසාධන ප්‍රතිපත්තිය පසුව රාජ්‍යයේ පරිපාලනය සඳහා බලපාන්නට ඇතැයි අනුමාන කළ හැකි ය. මන්දයත් ජනතාවගේ පක්ෂපාතීත්වය අපේක්ෂාවෙන් ජනතා සුබවිහරණය උපරිමයකට ගෙන ඒමට රජතුමා කටයුතු කළ බැවිණි. උක්ත සඳහන් කළ පරිදි මේ ක්‍රියාදාමය ක්‍රි. පූ. තුන් වන සියවසින් පසුව ඇති වූ බෞද්ධාගමික සංස්කෘතික ප්‍රබෝධයේ මහඟු ප්‍රතිඵලයකි. ඒ අනුව රජුගේ යුතුකමක් ලෙස ජනතා සුභසාධන ක්‍රියාකාරකම් ප්‍රසාරණය වීම සිදුවිය. ඒ ඔස්සේ ජන ප්‍රසාදය ද තහවුරු විය. රජවරුන් රට වැසියාගේ ආර්ථික දරිද්‍රතාවය අවම කිරීම උදෙසා කටයුතු කිරීම ප්‍රමුඛ කරුණක් විය. මේ කාර්යභාරය ඉටුකිරීම උදෙසා සිය පාලන නිලධාරීන් ද මේ සඳහා දායක කරගත් බව පෙනී යයි.

තුලාභාර දාන

තුලාභාර දාන පිළිබඳව විමසා බැලීමේ දී එය සුවිශේෂී දානයක් වූ බව පෙනේ. තුලා යන්නෙන් අදහස් කරනුයේ තරාදියයි. භාර යන්නෙන් අදහස් කරනුයේ බරයි. තුලාභාර යන්නෙන් අදහස් කරනුයේ යමෙකු තරාදියේ එක් පැත්තකට නැග තමාගේ බරට සමානව සිටින සේ තරාදියේ අනෙක් පැත්තට වස්තුව දමා කිරා දන්දීමයි. සිංහල සෙල්ලිපි වදන් අකාරාදියෙහි තුලාභාර යන්නෙහි අදහස තරාදියෙහි එක් තටුවක දායකයා නැගී ඔහුගේ බරට අනෙක් තටුව කිසියම් වස්තුවකින් පුරවා කිරා දීමයි *(රණවැල්ල, සිරිමල්, (2004), 120 පිටුව)*. සංක්ෂිප්තව සඳහන් කරන්නේ නම් බරට බර දන් දීම තුලාභාර දානයයි. මිනිසුන්ගේ බරට බර වස්තුව දන් දීම සාමාන්‍ය සිරිත වුවද ඇතැම් විට සතුන්ගේ බරට වස්තුව දන්දෙන ලද අවස්ථා දැකිය හැකි ය. එසේ සතුන්ගේ බරට වස්තුව දන් දීම ද තුලාභාර දානයේ ම එක්තරා ප්‍රභේදයක් යැයි සිතිය හැකි ය. ඇතෙකු බරට වස්තුව දන්දීම පිළිබඳ තොරතුරු ජාතකකතාවන්හි සඳහන් වෙයි.

ලංකාවේ තුලාභාර දීම කුමන ආකාරයෙන් පැවැත් වූයේ දැයි නිශ්චිතව කිව නොහැකි ය. එහෙත් හින්දු ක්‍රමය මත පවත්වන්නට ඇතැයි කිව හැකි ය. පුරාණ ග්‍රන්ථවල මහාදාන දෙන ලද අවස්ථා පිළිබඳව දැක්වෙයි. එහිදී විශේෂිත වන මණ්ඩප පිළියෙල කිරීම උදෙසා නීතිරීති පවා ඇති කර තිබේ. විවිධ ප්‍රමාණවලින් යුක්ත වූ අතර ආරුක්කුවලින් අලංකෘත දොරටු සතරක් ද ගඩොලින් තැනූ උස් වූ වේදිකාවක් ද ඊට අවශ්‍ය විය. මෙලෙස මණ්ඩපය පිළියෙල කිරීමෙන් පසු වේදය දන්නා ආගමික පූජකවරු පිළිවෙළින් සතර පැත්තෙහි සිටවනු ලැබී ය. ඉන් ඉක්බිතිව හෝම පූජා සතරක් ආදිත්‍ය, මරුත්, බ්‍රහ්ම, විෂ්ණු සීහ හා හිරු වෙනුවෙන් පවත් වනු ලැබී ය. යාඥ කිරීම් ද සිදු කරනු ලබයි. පසුව නොයෙකුත් වස්තු බ්‍රාහ්මණයන්ට දෙනු ලැබීය. නැවත දානය දෙනු ලබන්නා විවිධ සුදු වස්ත්‍ර ඇඳ

සුදු මල් මාලා පැළඳ විෂ්ණුට යාඥා කරනු ලැබී ය. පසුව තරාදියට ගොඩ විය. ඔහුට සම බරව සිටින සේ රත්රන් අනෙක් තරාදි තට්ටුවේ තබන ලදී. පසුව පොළොවට යාඥා කර ඔහු තරාදියෙන් බැස රන්වලින් භාගයක් ගුරුට දෙනු ලැබූ අතර බ්‍රාහ්මණයන්ට අතපැන් වත්කොට ඉතිරිය දෙනු ලැබී ය. ඊට පෙරින් දුප්පතුන්ට ගම්වැසියන්ට තෑගි පිරිනැමීම ද සිදු කෙරිණි. (History of Darmasastras, Vol.II, Part II, P.V.Kane, P.869,72) මේ සංක්ෂිප්ත විස්තරයෙන් ඉන්දියානු තුලාභාර දානය පිළිබඳව යම් අවබෝධයක් ලබාගැනීමට හැකි වේ. ලංකාවේ තුලාභාර දානය කුමන ආකාරයකට දෙනු ලැබුවේ ද යන්න පිළිබඳ විස්තර ඊට ආසන්න දක්නට නොලැබෙතත් ඉන්දීය ආභාසය යම් පමණකට හෝ අපට ලැබීමත් මත මේ ක්‍රමයටම හෝ ආකාරයකට පවත්වනු ලබන්නට ඇතැයි අනුමාන කළ හැකි ය.

ඈත අතීතයේ සිටම මේ සිරිත ඉන්දියානු ජනයා අතර තිබූ බවට සාක්ෂි ලැබේ. වෙස්සන්තර ජාතකයට අනුව ජාලිය කුමරු හා කෘෂ්ණ ජිනා කුමරි ජූජක බමුණාගෙන් බේරා ගත්තේ ඔවුන්ගේ බරට වස්තුව දන්දීමෙනි. *".......සඳමහරජාණෝ කුමාරයන්ගේ මිහිරි තෙපුල් අසා සතුටුව ජාලිය කුමාරයන්ට දහසක් දී කෘෂ්ණජිනාවන්ට උන්ගේ භාරයෙන් රන්රුවන් හා බොහෝ වස්තු හා සත්මහල් ප්‍රාසාදයක් ද බමුණාට දී දෙබිහින්නන් ගලවා ගත්හ...." (පන්සිය පණස් ජාතක පොත් වහන්සේ, 1861 පිටුව)* එමෙන් ම *මහාභාරතය* වැනි ඉන්දියානු සාහිත්‍ය කෘතීන්හි ද බරට බර දන්දීම පිළිබඳ සාධක දක්නට ලැබේ. භීෂ්ම විසින් යුධිෂ්ඨිරට පවසන ලද "රජ පරවියා හා උකුස්සා" පිළිබඳ එන කතාන්තරයෙන් එය මනාව පැහැදිලි වේ. උකුස්සෙකුට හසු වූ පරවියෙකු උගෙන් ගලවා ගැනීම උදෙසා බරණැස් නුවර වෘෂදර්භ නම් රජෙකු ඒ පරවියාගේ බරට සමාන වන සේ තමාගේ ශරීරයෙන් මස් කපා වෙන් කොට උකුස්සා වෙනුවෙන් තුලාභාර දානයක් දීමට ඉදිරිපත්ව මදි වූ කල සිය ශරීරයම දන් දීමට ඉදිරිපත් වූ අවස්ථාවක් පිළිබඳ *මහාභාරතයේ* ආරණ්‍යක පර්වයේ තුන්වැනි කොටසෙහි එකසිය තිස්වැනි ආධ්‍යායේ කියැවෙන්නේ මෙසේ ය. *"..........රජතුමනි, ඉදින් ඔබට මේ පරවියාම අවශ්‍ය නම් තමාගේ ශරීරයේ මස් කපා පරෙවියා හා තුලනය කරනු මැනවි...... ඉදින් ඔබගේ මස් පරෙවියාගේ හා සම වෙයි නම්, එවිට එය මට දෙනු මැනවි....... මම මගේ මස් මේ පරෙවියා හා කිරා ඔබට දෙන්නෙමි. රජතුමනි පරම ධර්මය දන්නාවූ උශීනර රජු ගේ මස් අතෙන් කපා පරෙවියා හා තරාදියක තබා කිරීමට පටන් ගත්තේ ය. තරාදියෙන් කිරීමේ දී පක්ෂියාගේ බර වැඩිවිය. රජු නැවත මස් කපා තරාදියට දැම්මේ ය. රජතුමා කෙතරම් ප්‍රමාණයක් මස් තරාදියට දැමුවත් පරෙවියා බර වූයෙන් රජු තමාම තරාදියේ වාඩි විය..........." (මහාභාරතය, 296-297 පිටු)* යනුවෙනි. දානය සඳහා දෙන ලද ද්‍රව්‍යය කෙසේ වුවද සිදු කර ඇත්තේ බරට බර දන්දීමකි.

දකුණු ඉන්දීය රජවරුන් අතර ද තුලාභාරදීමේ චාරිත්‍රය පැවති බවට සාධක ලැබේ. විජයනගර රාජධානියේ කෘෂ්ණරාය රජු තුලභාර දාන දුන් බව සඳහන් වේ. (EI;vol. VII p17) චෝළ රජුන් අතර ද තුලාභාර දීමේ සිරිත පැවතුණි. පළමු වැනි රාජ රාජ චෝළ රජුගේ සෙල්ලිපියක තුලාභාරම් ශ්‍රී කෝවිල් යන්න සඳහන් වීම තුළින් ද පැහැදිලි වේ. ට්‍රැවන්කෝර්යේ මාර්කණ්ඩවර්මන් රජුගෙන් පසු රජකමට පත් සෑම රජෙකුම පාහේ තුලාභාර උත්සවය පැවැත් වූ බව පෙනේ. මේ තුලාභාර දානමය උත්සවය පැවැත් වීමෙන් පසුව රජුට කුලශේකර පෙරුමාල් යන විරුදය ලැබීමත් පාරම්පරික සිහසුනට පවතින උරුමය තහවුරු වීමත් සිදුවීම විශේෂිත ය. කිසියම් පාලකයෙකුට ට්‍රැවන්කෝර්යේ බලය ලබාගැනීමට හිරණ්‍යර්භම් උත්සවය ප්‍රමාණවත් වුවත් ඊට සුදුසුකමක් ලබා ගැනීමට ඔවුන්

විසින් තුලාභාර උත්සවය පවත්වනු ලැබී ය. එමෙන් ම එයින් ඔවුන් අතර තුලාභාර දීම අභිෂේකය පිළිබඳ එක් චාරිත්‍රයක් බවට පත්වී තිබුණි. මේ අනුව බලන විට පැහැදිලි වන්නේ ඉන්දියානු රජවරුන් අතර ද තුලාභාර දාන දීම ප්‍රචලිතව පැවති බව ය. පරාක්‍රමබාහු රජුගේ සිට රජවරු වාර්ෂිකව පවත්වන අභිෂේකෝත්සවයේ ද තුලාභාර දාන පවත්වන්නට ඇතැයි සිතිය හැකි බවට රෝහණදීර මහතා අදහස් දක්වා තිබේ. (රෝහණදීර, (1998), 136-138 පිටු)

ලක්දිව රජවරුන් දෙන ලද තුලාභාර දාන හා ඒවායේ අරමුණු

ලංකාවේ රජුන් විසින් දෙන ලද තුලාභාර දාන පිළිබඳව විස්තර සාහිත්‍යයේ මෙන්ම ශිලා ලිපිවලින් ද හමු වේ. නමුත් ඒවායේ ද ලංකාවේ රජවරුන් තුලාභාර දෙන ලද ආකාරය පිළිබඳ පැහැදිලි විස්තරයක් දක්නට නොලැබේ. *මහාවංසය, ථූපවංසය, දළදාසිරිත හා රාජාවලිය* තුලාභාර දාන පිළිබඳව දක්වයි. පර්යේෂණයට අදාල කාර්යභාරයේදී තුලාභාර දාන දීමේ අරමුණු කෙබඳු වීදැයි පළමුව සොයා බැලිය යුතු ය.ඒ අනුව

- ජන ප්‍රසාදය ලබා ගැනීම
- ජනතා සුබ සාධනය අපේක්ෂා කිරීම
- පිං පිණිස
- හිත සුව පිණිස

යන මෙම අරමුණු තුළට ඇතුළත් වූ ජනතා සුබ සාධනය අපේක්ෂා කිරීම, පිං පිණිස හා හිත සුව පිණිස යන කාරණයන් මුල් කොට ගත් ප්‍රමුඛතම කාරණය ජනතා ප්‍රසාදය දිනා ගැනීම යැයි අනුමාන කළ හැකි ය. පිං පිණිස හා හිත සුව පිණිස යන කාරණයේදී භාතිකාභය රජු (ක්‍රි.පූ.19 - ක්‍රි.ව.9) පිළිබඳව *ථූපවංසය* දක්වන තොරතුරු අතර *"අවුරුදු පතා බුද්ධරත්නයට ධම්මරත්නයට සංඝරත්න යන තුණුරුවනට තුලාභාර දාන දුන්නේ යැයි"* යන සඳහන වැදගත් කොට සැලකිය හැකි ය *(ථූපවංසය, 211පි).* රාජාවලිය දක්වන්නේ අනුරාධපුර යුගයේ මහා දාඨික මහානාග රජු (ක්‍රි.ව.9 -21) මුහුද මැද සරසන ලද ඔරුවල සූවිසි දහසක් භික්ෂූන් ඉඳුවා පෙරවරුවේ තුලාභාර දන් දුන් බවකි (රාජාවලිය, 192 පිටුව).

දළදා සිරිතෙහි දැක්වෙන්නේ *".............ලක්දිව අත් ගෙන දෙමළුන් පලවා තුන් රජය එක්සත් කොට අරමණයෙන් මහසඟන ද තෙවළා සහම් පොත් ද නොවළා ගෙන්වා ලෝ සසුන් වැඩ කළ මහලු විජය බාහුය, ජයබාහුය, විකුම්බාහුය, ගජබාහුය, වළගම්බා රජයෙහි පටන් නකා භේද ඇතිව පැවත ආ බුදු සසුන් පිරිසිදු කර සඟමොක් සුව පතාමාලු කමක් දළදා පුදයක් තුලාභාර දීම් ආදී මඟුල් සිවු ඇටක් ද කර......." (දළදාසිරිත, 70,126 පිටු)* යනුවෙනි. ඒ තුළින් පැහැදිලි වන්නේ මේ රජවරුන්ගේ කාලවල සිදු වූ ශාසනික විලෝපකාරී දේ වලකාලමින් බුදු සසුනේ චිර පැවැත්ම උදෙසා පිං පිණිස හා හිත සුව පිණිස අවුරුද්දක් පාසා උපසම්පදාවත් දළදා පූජාවත් තමාගේ බර ප්‍රමාණයට දන්දීම් ආදී උත්සවත් පැවැත් වීමට රජවරුන් කටයුතු කළ බවයි. දෙවන දප්පුල රජු (ක්‍රි.ව.815-931) ද *"තුලාභාරඤ්ච දාපෙසි" (මව;47:79)* යන මහාවංසය දක්වන ගාථා පාඨයෙන් තුලාභාර දුන් බව පැහැදිලි වෙයි. කීර්තිමත් වූ දෙවන උදය රජු (ක්‍රි.ව.887-898) ද *"අදාසී ච තුලා භාරං තිකඛතතුං සො මහායසො" (මව;49:127-128)* තුලාභාර දාන ආගමානුකූලව භික්ෂූන් වෙත ලබා දී තිබේ. තුන්වන මහින්ද (ක්‍රි.ව.801-804) තුලාභාර දානය දෙන ලද රජෙකි. *(මව.,54:27)*

දෙවරක් භික්ෂූන් වහන්සේලාට තුලාභාර දුන් බව කියයි. එමෙන් ම පොළොන්නරු රාජධානි කොට ගත් පළමු වන විජයබාහු රජු (ක්‍රි.ව.1055-1070) සොළී විබලයෙන් රට මුදවා ජනතා සුභ සාධනය උදෙසා බොහෝ කටයුතු සිදු කළ බව වංසකතා තුළින් හෙළි වෙයි. *"......තුන් නිකායට තුලාභාර පරිත්‍යාග කළ බව......" (මුන්රු තුලාභාරම් මූන්රු නිකායත්තු කුඩුත්තු.....)* *වේළයික්කාර් සෙල්ලිපිය මේ සඳහා කදිම නිදසුනක් වේ. (Ez;II,No.40,p.242-255)*

ජනතා සුභ සාධනය අපේක්ෂා කිරීම අරමුණු කර ගනිමින් කටයුතු කළ රජවරු බොහෝ ය. *මහාවංසය* දක්වන ආකාරයට දෙවන සේන රජු (ක්‍රි.ව.853-887) *"තුලාභාර දීමෙන් **බැගෑපත් වූ අනාථයන්** සැතැප්පවී" (මව;51:64)* යන කාරණය සඳහන් කරයි. පළමු වන විජයබාහු රජු *".....තුන්වරක් **බැගෑපතුන්ට** තුලාභාර දෙවි...... " (මව;60:21)* යැයි දක්වයි. පළමුවන පරාක්‍රමබාහු රජු *"........බෙරපියවි කරවා **යදියන් රැස් කොට** අවුරුදු පතා තුලාභාර මහ දන් දෙවී........." (මව;73:11)* යැයි සඳහන් කර ඇත. බැගෑපත් වූ අනාථයන්, දිළින්දන් රැස් කරමින් උත්සවාකාරයෙන් තුලාභාර දාන දුන්නේ ජනතාවගේ ආර්ථික සමෘද්ධිය ඇති කරනු පිණිස වුව ද රාජත්වය තහවුරු කර ගැනීම උදෙසා රජු යුහුසුළු වූ අවස්ථාවක් ලෙස ද පෙන්වාදිය හැකි ය. ඇත්තෙන්ම රාජකීයභාවය පවත්වා ගැනීම උදෙසා රජවරු ජනතා නැගී සිටීම් අවම කිරීමට මෙය උපක්‍රමයක් කොට ගත්තාදැයි සිතේ. මේ බව වඩාත් තහවුරු වන කාලය නම් නිශ්ශංකමල්ල රාජ්‍ය කාලයයි (ක්‍රි.ව.1186-1196). පොළොන්නරු යුගයේ දී මේ සිරිත පැවති බවට සාධක රාශියක් දක්නට ලැබේ. මහා පරාක්‍රමබාහු රජතුමාගෙන් පසුව තුලාභාර දෙන ලද බවක් *මහාවංසයෙහි* සඳහන් නොවේ. එහෙත් නිශ්ශංකමල්ල රජුගේ ලිපි රාශියකම එතුමා දුන් තුලාභාරදාන පිළිබඳව විශේෂයෙන් ම සඳහන් කරන්නේ ***"......පෙර රජවරුන් නොකළ විරූ ලෙසැ** හවුරුදු පතා තුලාභාර නැගී.........." (ප්‍රීතිදාන මණ්ඩප ලිපිය)* පෙර නොවූ විරූ ආකාරයෙන් ලබා දුන් බවයි. මෙහි අරමුණ වන්නට ඇත්තේ දේශපාලන අභියෝග උපරිමයෙන් ජයගැනීම විය හැකි ය. නිශ්ශංකමල්ල රජුට එල්ල වූ දේශපාලන අභියෝග අතරෙහි ප්‍රමුඛ වූයේ, විජාතිකත්වයයි. මන්ද පැරණි ලංකාවේ දේශීය ජන නායකයෙක් ජනතා නියෝජනයෙන් රාජ්‍යත්වයට පැමිණි බව දක්වන කාරණයේ දී නිශ්ශංකමල්ල රජුගේ විජාතිකත්වය බල නොපෑවේ යැයි කිසිසේත් කිව නොහැකි ය. රජු බෞද්ධයෙකු වෙමින් ජනතාව විෂයෙහි මෙපමණ කැපකිරීමක් සිදු කරන්නේ සිය රාජත්වයේ අනාගත අභිවෘද්ධියෙහි පැවැත්ම උදෙසා ය. ජනතාවගේ ප්‍රසාදය පක්ෂපාතීත්වය වඩ වඩාත් තහවුරු කරගැනීම සෑම රජෙකුටම මුහුණ පෑමට සිදු වූ අභියෝගාත්මක කාරණයකි. නිශ්ශංකමල්ල රජුට මේ තත්ත්වය දැඩිව දැනෙන්නෙකු බවට පත්වන්නේ එතුමාට එල්ල වූ තීරණාත්මතක අභියෝග රැස මුල්කර ගනිමිනි. එනම්,

- විජාතිකත්වය
- මහා පරාක්‍රමබාහු රජුගේ ජනප්‍රියත්වය
- පරාක්‍රමබාහු රජුගේ හමුදාපතීන්
- ගොවිකුලයේ ජනයා
- රුහුණු ජනයාගේ නැගී සිටීම්

වැනි දේශපාලන අභියෝග රැසකි. මේ සියල්ල මධ්‍යයේ නිශ්ශංකමල්ල රජතුමා හැම විටම සඳහන් කරනුයේ කාලිංගයේ සිට ආරාධිතව ලක්දිවට පැමිණියෙකු වූ තමා කලිංග වැසියෙකු බවයි. *"........උතුම් දඹදිව්හි කලිඟුරටැ සිංහපුරයෙහි මෙමැ රජපරපුරට තිලකයක් බඳු......."* ගල්පොත ලිපියෙහි දැක්වීම ඊට නිදසුන් කළ හැකි ය. ගොවි කුලයේ ජනයා නිලතල දැරුව ද රජකම ලබා ගැනීම සඳහා ඔවුන්ගේ අභිමතාර්ථයන්ට අනුබල දෙමින් ඔවුනට එකතු වන ලෙස ගල්පොත ලිපියෙන් පැහැදිලිවම අවවාද කර ඇත. එපමණක් නොව රජකම පතන ගොවිකුල ජනයා හංසයන් හා සිංහයන් අනුකරණය කිරීමට තැත් කරන කපුටන්ට හා හිවලුන්ට ද සමාන කර ඇත්තේ *"......කාකයා හංසගතියට ද කොටලුවා සෛයින්ද්‍රවයන්ට ද ගැඩහුලා නාගයන්ට ද කනාමැදිරියා සූර්ය ප්‍රභාවයට ද වටුවා හස්තීන්ට ද කැනහිලා සිංහයන්ට ද භාව කරන්නා සේ ගොවිකුලයේ ඇත්තන් රාජ්‍ය ලීලාව නොපැතුව මැන......" (Ez;vol.II.p.99-101)* යනාදී වශයෙනි. ගොවිකුල ජනයා රජකම ලබාගැනීමට තැත්කිරීම නිශ්ශංකමල්ල රජු හෙළා දකින අතර ඊට අනුබල දෙන්නන් රාජද්‍රෝහීන් ලෙස ද සලකා ඇත. තව ද චෝළ, පාණ්ඩ්‍ය, කේරළ ආදී අබෞද්ධ කුමාරවරුන් රජකමට පත් නොකර ගන්නා ලෙස ද එසේ වන අයගේ විනාශය ද ඇති කරන බව දක්වා තිබේ. මෙයින් පෙනී යන්නේ කිසිවකු හෝ බලයෙන් රජකම ලබාගතහොත් ඊට විරුද්ධව නැගී සිටීමට තරම් කුමාරයින් හා ප්‍රධානීන් සිටි බවයි. මේ ආකාරයට රජු සහ රාජසභාව ඇතුළත වූ මධ්‍ය පරිපාලන තන්ත්‍රය ආශ්‍රිතව පැවති අර්බුදකාරී දේශපාලන වාතාවරණය හැරුණ විට තම රාජධානියෙන් දුර බැහැර ප්‍රදේශවල මතුව තිබූ ව්‍යාකූලතාවලටද මුහුණ දීමට නිශ්ශංකමල්ල රජුට සිදුවූ බව පෙනේ. එමෙන්ම මායාරට සහ රජරට වැසියන්ගේ දෝෂ දර්ශනයට ලක් නොවන ආකාරයට විසීමට වගබලා ගන්නා ලෙස රුහුණු ජනතාවට කරන ලද ආයාචනයක් කටුගහගල්ගේ ලිපියෙන් අනාවරණය වේ. *"රුහුණු රජයෙහි ඇත්තවුන් කෙරෙහි කරුණායෙන් කියම්හ. ධන ධාන්‍ය දාසි දාසයන් ඇතිව ජීවත් වන්නා කැමැත්තම්හ. මායා රජයෙහි පිහිටි රජයෙහි ඇත්තවුන් අතින් නින්දා පරිභව නොඅසා ලෝභව අනුන් ගැත්තට ආශා නොකොට බත් කෑ බුලත් කෑ මතට උඩත නොව රූණෝ නිවංචාවෝය ස්වාමි පක්ෂපාත ගැත්තෝ යැයි කියවව......"* (*Ez;vol.III.p.325-331)* මෙලෙස ආයාචනයන් කළේ එම ප්‍රදේශවල ජනතාව තමාට විරුද්ධව නැගී සිටීම වලකාලීමේ පූර්ව කටයුත්තක් ලෙස විය යුතුය. මේවායින් මිදීම උදෙසා ගතයුතු ඵලදායී ක්‍රියාදාමය නම් ජනතාවගේ පක්ෂපාතිත්වයයි. ඒ සඳහා අනුගමනය කළ එක් ක්‍රියා මාර්ගයක් ලෙස තුලාභාර දීම වැනි පුණ්‍ය කටයුතු ගිහි පැවිදි දෙපක්ෂයටම ලබාදීම මෙහිදී පෙන්වා දිය හැකි ය. නිශ්ශංකමල්ල රාජ්‍යකාලය ගත් විට වසර නවයක් වැනි කෙටි කාලයක් වුවද ජනතා හිතෛෂී ලෙස කටයුතු කරන්නට උත්සාහ ගෙන තිබෙන බව පැහැදිලි ය. තුලාභාර දීම ම පමණක් ගත් විට වුව ද නිශ්ශංකමල්ල රජතුමා කැපී පෙනෙන වෙනසක් ඒ තුළ ඇති කරන්නට කටයුතු කළ බව එතුමාම සඳහන් කරයි. එතුමාගේ රාජකීය පවුලේ උදවිය මේ උතුම් පුණ්‍ය කටයුත්ත ඉටු කරදීම කෙරෙහි යොමු කරවා ගත්තේ අහේතුකව යැයි කිව හැකි ද? ඇත්තෙන්ම රජුට මෙම අවස්ථාවේ අවශ්‍ය වූයේ ජනතා ප්‍රසාදය තුළින් රාජත්වය තහවුරු කර ගැනීමට ය. ඒ තුළින් දිගු කාලයක් පුරාවට බිඳහෙළීමට නොහැකි බලයක් රජු වෙත පවරා ගැනීමට ය. දුස්ථ ලංකාවාසීන් ස්වස්ථ කිරීම එතුමාගේ අපේක්ෂාව බව නිරන්තරයෙන් සෙල්ලිපි මගින් ජනතාවගේ නෙත ගැටෙන පරිදි ජනතා සිත් සතන් රඳවන්නට උත්සාහ ගත්තේ ද මේ නිසා යැයි සිතිය හැකි ය.

ආභරණ හා වොටුණු සහිතව අනෙක් රජුන් තනිව තුලාභාර නැගුණ ද නිශ්ශංකමල්ල රජු පමණක් නොව සිය පවුලම හා සමඟ තුලාභාර නැගුණු බව එතුමාගේම ශිලා ලේඛනවලින් පෙනෙයි. එහිදී අනුරපුර රුවන්වැලි ලිපිය, ප්‍රීතිදාන මණ්ඩප ලිපිය, පොළොන්නරු කලා ක්‍රීඩා විනෝද ගල්ආසන ලිපිය, හැටදාගේ ප්‍රවේශ ලිපිය, ගල්පොත ලිපිය විශේෂ කොට දැක්විය හැකි ය. අනුරපුර රුවන්වැලි ලිපියෙහි දැක්වෙන ආකාරයට

"මා දවස කැත් නොසිතා සුවසෙ පසුව මනැයි පෙර රජ දරුවන් නොසිතු විරූ ලෙස තුලාභාර නැගෙමිය සිතා වදාරා .... වීරබාහු මහපාණන් වහන්සේ අග මෙහෙසුන් කාලිංග සුභද්‍රා බිසවුන් වහන්සේ හා තුන්දෙනා වහන්සේ තුලාභාර නැගී.........." (Ez;vol. II.p.77) යැයි දක්වා තිබේ.

ඒ අනුව රජු මෙන්ම වීරබාහු මහපා, අගමෙහෙසිය කාලිංග සුභද්‍රා තුලා නැගියවුන් විය. මේ ලිපිය පිහිටුවා ඇත්තේ නිශශංකමල්ල රජුගේ හතරවැනි අවුරුද්දේ දී ය. පස්වන අවුරුද්දේ දී පිහිටු වන ප්‍රීතිදාන මණ්ඩප ලිපියේ ඉහත දැක් වූ තිදෙනාට අමතරව ගඟ වසැ කල්‍යාණ මහා දේවීන් වහන්සේ ද තුලාභාර නැගී තිබේ. පොළොන්නරු කලා ක්‍රීඩා විනෝද ගල්ආසන ලිපියෙහි හවුරුදු පතා සතර තුලාභාරයක් නැගිනැයි සඳහනක් වෙයි. ගල්පොත ලිපියේ අගමෙහෙසිය වූ කාලිංග සුභද්‍රා, ගඟ වසැ කල්‍යාණ මහා දේවීන් වහන්සේ රජු මහපාණන් දුව සර්භාංග සුන්දරී ඇතුලු පිරිස තුලාභාර නැග ඇති බව ගල්පොත ශිලා ලිපියේ තිබේ.

> *"ගගවංස කල්‍යාණ මහ දෙවීන් වහන්සේ හා සහවොටුනු රජබරණින් සැදි උරෙහි දා දරු මහපාණන් හා දූ සබ්බාග සුන්දරීන් වහන්සේ හා එක්වැ තුලාභාර නැගී හවුරුදු පතා පස්තුලාභාරයක් බැගින් දී...."*
>
> *(Ez;vol.II.p.106)*

එතුමාගේ හැටදාගේ ශිලා ලිපියට අනුව ඉහත සඳහන් කළ රාජකීයන්ට අතිරේකව නිශ්ශංකමල්ල රජු ඇතුලු වික්‍රමබාහු ඈපාණන්, පාර්වතී, චන්ද්‍රා බිසවුන් ඇතුලු රාජකීය පිරිස තුලාභාර නැගි බව දක්වයි. *(Ez;vol.II.p.93)* මේ සඳහන්වලින් පෙනෙන්නේ තුලාභාර ගණන් ගත්තේ නගින පුද්ගලයන්ගේ ගණනට අනුව පමණක් නොව වාර්ෂිකව රාජකීයයන් එකිනෙකා වැඩි කිරීමෙන් බවයි. නිශ්ශංකමල්ල රජුගේ හතර වෙනි අවුරුද්දේ දී තුනක් ද පස් වෙනි අවුරුද්දේ දී හතරක් ද හය වන අවුරුද්දේ දී පහක් ද ආදී වශයෙන් සංඛ්‍යාත්මකව වැඩිකරමින් තුලාභාර දාන ලබා දුන්නේ ජනතා ප්‍රසාදය ලබා ගැනීම සඳහා යැයි සිතිය හැකි ය. තුලාභාරදානදීමේ පුණ්‍ය ප්‍රතිපත්තිය පෙර රජසිරිතට අනුව ශක්තිමත්ව ඉදිරියට ගෙනයමින් යම් තරමකට හෝ දිනා ගත් ජනතාවගේ ප්‍රසාදය වඩ වඩාත් තහවුරුකරගැනීම උදෙසා රාජකීයයන් එක්කර ගත්තා ද විය හැකි ය. නිශ්ශංකමල්ල රජතුමා පොදු ජනතාවගේ ගෞරවාදරය තමා වෙතට යොමු කරගැනීම උදෙසා විශාල ප්‍රචාරක ප්‍රතිපත්තියක් අනුගමනය කළ අයෙක් බව තවදුරටත් අනාවරණය කර ගැනීම අසීරු නොවේ. නව අවුරුදු පාලන කාලය තුළ සිදු වූ කැපී පෙනෙන සේවාව තුළ පොදු ජනතාවට විවිධ සහනයන් සලසා දෙමින් විවිධ වස්තු පරිත්‍යාග කරමින් ඒවා සියල්ල සෙල්ලිපි මගින් ප්‍රචාරයකිරීමට සමත් වීමම ඊට හේතුවයි. නිශ්ශංකමල්ල රජතුමා කළ පරිත්‍යාග අතර *මුතු, මැණික්, පබළු ආදී නොයෙක් රත්රන් ද ගෝ, මහිෂ, ධන,*

ධාන්‍ය, දාස දාසියන් ද දිවෙල්, ගම්, පමුණු ද විවිධ වස්ත්‍රාභරණ ද රන් වළං, රිදී වළං ද ඇතුළත් වෙයි. *(Ez;II,p.139)* මේ පරිත්‍යාග ලැයිස්තුව සෑම ලිපියකම පාහේ පිළිවෙළකට යොදාගෙන තිබෙනු දක්නට ලැබේ. තමන් *ලෝවැස්සන්ගේ පිණින් උපන් කල්ප වෘක්ෂයක්* සේ යි. *(Ez;II,p.105)* දක්වන ලද සඳහනකට අනුව එතුමා පරිත්‍යාගශීලීත්වය ප්‍රගුණ කළ අයෙකු බව වැටහේ. මේ ධන පරිත්‍යාගයන් අතර තුලාභාර දාන වැදගත් තැනක් ගනී. නිශ්ශංකමල්ල රජතුමාගේ පාලන කාලය තුළ පෙර රජවරුන් නොකළ ආකාරයේ තුලාභාර දුන් බව අනුරාධපුර පුවරු ලිපියේ එන සඳහනින් පැහැදිලි කර ගත හැකි ය. *"..... කාත් නොසිගා සුව සේ විසුව මැනවයි* ***පෙර රජදරුවන් නොකළ විරූ ලෙසක තුලාභාර නැගෙමියි*** *සිතා වදාරා තුලාභාර නැගුණු බව................" (Ez;II,p.77)*

මේ තුළින් අනාවරණය කරගත හැකි වන්නේ වැසියාට ධන පරිත්‍යාග කොට දුප්පත්කමින් මිදීම උදෙසා තුලාභාර දානය රජවරු පෙර නොකළ ආකාරයට ලබා දෙමින් ජන ප්‍රසාදය දිනා ගැනීමට නිශ්ශංකමල්ල රජතුමා කටයුතු කළ බවයි. මහජන දුක්ගැනවිලි නිවාරණය තුළින් ප්‍රසාදය ලබා රාජ්‍යත්වයට එල්ල වූ අභියෝග ජය ගන්නට උත්සාහ දැරූ තවත් අවස්ථාවක් ලෙස දඹුලුගිරි ලිපිය පෙන්වා දිය හැකි ය.

> *".........හවුරුදු පතා පස් තුලාභාරයක් බැගින් රන් රුවන් මුතු රිදී ඈ නො එක් වස්තු හා දී ලංකාවාසීන් ස්වස්ථ කරවා..... තුලාභාර වස්තු දානයෙන් මුළු දිළිඳුන් සිත් පුරා* ***එතන්හි බොහො කලක් පවත්නා නියායෙන් ජය සතම්*** *(හ කොටැ නිශශංකෙශවරයැ)........."*
>
> *(ශිලා ලේඛන සංග්‍රහය, 63පිටුව)*

දිළින්දන්ට දනය ලබා දී එතැන ස්ථම්භ පවා ඉදිකිරීම් සිදු කළ බව සඳහන් කිරීම තුළින් මේ රජු තුලාභාර දීම කෙතරම් වැදගත් අවස්ථාවක් බවට පත් කර ගත්තේ ද යන්න පැහැදිලි ය. දොරටියාව සන්නස ද තුලාභාර දාන දීම පිළිබඳව දක්වන තොරතුරුද මෙහි දී වැදගත් වේ.

> *"....බොහොසත් දිනූ සහ වොටුනු රජබරන කිර බොහොසත් සින සහ වොටුණු රජබරණ කිර නවුදු දුඇතුල තල(ක) අරා කපතුරුමෙන් නොමී නන්රුවන් ණවුදු රුදුතප අරා කප්තුරුමෙන් නොමින් නන්රුවන් දන්(ල).... දෙසෙනොළ මුළු දිළිඳු ...."*
>
> *(JRAS(CB),Vol;XXIX,No.70)*

පොළොන්නරු යුගයේ රජවරුන් බොහෝ දෙනෙක් ම තුලාභාර දුන් බව ශිලා ලිපිවලින් මෙන්ම සාහිත්‍යයෙන් ද කියැවෙන බැවින් පොළොන්නරු යුගය වන විට තුලාභාර දානය දීම රජුන් අතර ප්‍රචලිතව තිබෙන්නට ඇතැයි සිතිය හැකි ය. එහෙත් නිශ්ශංකමල්ලගෙන් පසුව තුලාභාර දානය දීම පිළිබඳ තොරතුරු විරල ය. ඇතැම් විට පොළොන්නරු යුගයෙන් පසුව ඇති වූ අභ්‍යන්තර පීඩා හා ආර්ථික පීඩනයත් නිසා මේ සිරිත අභාවයට ගියේ යැයි සිතීමට හැකි ය. කුමන හේතුවක් නිසා හෝ මේ යුගයෙන් පසුව මේ සිරිත නැතහොත් චාරිත්‍රය ක්‍රමයෙන් අභාවයට යමින් තිබූ බව කිව හැකි ය.

නිගමනය

අනුරාධපුර යුගය තුළ දෙනු ලැබූ තුලාභාර දාන පිළිබඳව *මහාවංසයෙන්* හෙළි වන පරිදි දෙවන දප්පුල, දෙවන සේන, තුන්වන මහින්ද සහ දෙවන උදය යන රජවරුන් මෙන්ම පොළොන්නරු යුගය තුළ මහා විජයබාහු, මහා පරාක්‍රමබාහු නිශ්ශංකමල්ල යන රජවරු ප්‍රමුඛ වේ. මේ රජවරු සියලු දෙනා අතුරෙන් නිශ්ශංකමල්ල රජු හැර ඉතිරි අය තුලාභාර නැගී තිබෙන්නේ තමා පමණක් බව පැහැදිලි වෙයි. එහෙත් නිශ්ශංකමල්ල රජතුමා තමා සමඟ තම පුතු ද අග බිසව ද ඇතුලුව රාජකීය පවුලේ උදවිය තුලාභාර නැග තිබීම විශේෂිත ය. මේ තුළින් සුවිශේෂී තුලාභාරදානයක් ජනතාව උදෙසා ලබා දීමට නිශ්ශංකමල්ල රජතුමා කටයුතු කර තිබේ. අනුරාධපුරයෙන් හමු වන තුලාභාර දානය පොළොන්නරු යුගයේ දී රාජකීය පවුල තුළට විසරණයවීමක් දක්නට ලැබේ. මේ අනුව ලක්දිව බෞද්ධ රජවරුන් පොදු මහජනතාවගේ සුභ සිද්ධිය ප්‍රාර්ථනා කරමින් ම ආර්ථික සමෘද්ධිය පිණිසත් පින් රැස්කරගැනීම උදෙසාත් කළ බව සේ ම ඍජුව නොවුණත් වක්‍ර ආකාරයෙන් සිදුවූයේ ජනතාවගේ ප්‍රසාදය දිනාගැනීමට කටයුතු කිරීම යැයි කිව හැකි අතර හුදෙක්ම දේශපාලනය කේන්ද්‍ර කොට ගත් ජන ප්‍රසාදය දිනීමේ ක්‍රියාමාර්ගයක් බව ද සඳහන් කළ හැකි ය. කිරුම් මිණුම් ක්‍රම තුළ තරාදි භාවිතයේ උපරිමයක් පෙන්වන තුලාභාර දානය රාජ්‍යයේ ආර්ථික සමෘද්ධිය හෙළිකරන්නක් ද වන බව කිව හැකි ය.

ආශ්‍රිත ග්‍රන්ථ නාමාවලිය

ථූපවංසය, (2005), සංස්: වී. ඩී. එස්. ගුණවර්ධන, සමයවර්ධන පොත්හල, කොළඹ.

දළදාසිරිත, (2008), ගුණවර්ධන වී.ඩී. එස්., (සංස්;) ඇස් ගොඩගේ සහ සහෝදරයෝ, කොළඹ.

දළදාසිරිත, (2008), සිරිසුමන හිමි, තිඹිරිවැව, විශ්ව ග්‍රැෆික්ස් පුද්ගලික සමාගම, පන්නිපිටිය.

පන්සිය පණස් ජාතක කතා පොත් වහන්සේ, (2007), ගුණසේන සහ සමාගම, කොළඹ.

මහාභාරතය, (2004), ආරණ්‍යක පර්වය I, තෙවැනි කොටස, පඤ්ඤාකිත්ති හිමි, හිරිපිටියේ, (පරි), ඇස් ගොඩගේ සහ සහෝදරයෝ, කොළඹ.

මහාවංසය, ප්‍රථම භාගය, (1996) සිංහලානුවාදය, හික්කඩුවේ ශ්‍රී සුමංගල මාහිමි සහ බටුවන්තුඩාවේ දේවරක්ෂිත පඬිතුමා, *එස්. ගොඩගේ සහෝදරයෝ, කොළඹ.*

මහාවංසය, දෙවන භාගය, (1996) සිංහලානුවාදය, හික්කඩුවේ ශ්‍රී සුමංගල මාහිමි සහ බටුවන්තුඩාවේ දේවරක්ෂිත පඬිතුමා, එස්. ගොඩගේ සහෝදරයෝ, කොළඹ.

මහාවංසො (අනුරාධපුර රජජයුගං), (2008), සංස්: ඉලංගසිංහ, මංගල, ඇස් ගොඩගේ සහ සහෝදරයෝ, කොළඹ.

රාජාවලිය, (1997), සුරවීර. ඒ. වී., අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව, කොළඹ.

රණවැල්ල, සිරිමල්, (2004), *සිංහල සෙල්ලිපි වදන් අකාරාදිය,* පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව, කොළඹ.

කරුණාරත්න, සද්ධාමංගල (පරි:), (2000), *ශිලා ලේඛන සංග්‍රහය, පළමු වෙළුම,* වික්‍රමසිංහ, මර්තීනු ද සිල්වා (සංස්:), පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව.

රෝහණදීර, මැන්දිස්, (1998), *නිශ්ශංකමල්ල - පොළොන්නරුව,* තරංජී ප්‍රින්ට්ස්, මහරගම.

ලියනගමගේ, අමරදාස, ගුණවර්ධන, රණවීර, (1965), *අනුරාධපුර යුගය,* විද්‍යාලංකාර විශ්වවිද්‍යාලයීය මුද්‍රණාලය.

ලංකා විශ්වවිද්‍යාලයේ ලංකා ඉතිහාසය, I කාණ්ඩය, I භාගය, (1964) පර්යේෂණාංශයේ සිංහල පරිවර්තනය, විද්‍යාලංකාර විශ්වවිද්‍යාලය, කැලණිය.

ලංකා විශ්වවිද්‍යාලයේ ලංකා ඉතිහාසය, I කාණ්ඩය, II භාගය, (1972) සිංහල පරිවර්තනය, විද්‍යාලංකාර විශ්වවිද්‍යාලය, කැලණිය.

Epigrphia Zeylanica, Vol., II, (1928) Wickmasinha, Zilva, (Ed.), Archaeological Survey of Ceylon, Oxford University Press, London.

Epigrphia Zeylanica, Vol., III,(1933) Paranavithana, Senarath, (Ed.), Archaeological Survey of Ceylon, Oxford University Press, London.

Epigrphia Zeylanica, Vol., IV, (1943) Paranavithana, Senarath, (Ed.), Archaeological Survey of Ceylon, Oxford University Press, London.

Epigrphia Zeylanica, Vol., V, (1966) Paranavithana, Senarath, (Ed.), Archaeological Survey of Ceylon, Oxford University Press, London.

Journal of the Ceylon Branch of the Royal Asiatic society, (1924), Vol., XXIX, No.70, Part I, II, III, IV. The Colombo Apothecaries Company, LTD.